අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2011 අගෝස්තු

**General Certificate of Education (Adv. Level) Examination, August 2011**

බෞද්ධ ශිෂ්ටාචාරය **I** / පැය දෙකයි.

**Buddhist Civilization I / Two hours**

---

**උපදෙස් :**

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- 01 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා ගෙන එය **උත්තර පත්‍රයේ පසුපස දක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

---

01. බ්‍රාහ්මණ ඉගැන්වීමට අනුව බ්‍රාහ්මණ - ක්ෂත්‍රිය - වෛශ්‍ය - ශූද්‍ර යනුවෙන් හඳුන්වනු ලබන්නේ,
    (1) වර්ණ ධර්මයයි. (2) ආශ්‍රම ධර්මයයි. (3) ස්ව ධර්මයයි.
    (4) ආපද් ධර්මයයි. (5) නියාම ධර්මයයි.

02. බ්‍රාහ්මණ සම්ප්‍රදාය විසින් පුද්ගලයාගේ ජීවිතය අවධි හතරකට බෙදා දක්වනු ලබයි. එහි ලා **බ්‍රහ්මචාරී අවධියේ දී** සපිරිය යුතු මූලික කාර්යය ලෙස අවධාරණය කරනු ලබන්නේ,
    (1) ගෘහ ජීවිතය අතහැර බ්‍රහ්මචාරී ව විසීමයි.
    (2) බ්‍රහ්මචාරී ව තිසි අධ්‍යාපනයක් ලබා ගැනීමයි.
    (3) දිවි ඇතිතාක් බ්‍රහ්මචාරී ව විසීමයි.
    (4) බ්‍රහ්මචාරී දිවියෙන් මිදී විවාහ ජීවිතයක් ගත කිරීමයි.
    (5) සන්‍යාසියකු ලෙස බ්‍රහ්මචාරී ජීවිතයක් ගත කිරීමයි.

03. වෘක්ෂලතා, කෘමීන්, පක්ෂීන්, සිවුපාවුන් අතර ඒ ඒ ජාතිවලට අයත් ලිංග විශේෂතා ඇතත්, මිනිසුන් අතර එවැනි විවිධත්වයක් දකිය නො හැකි බව බුදුරජාණන් වහන්සේ **වාසෙට්ඨ සූත්‍රයේ** දී දේශනා කොට ඇත. මෙ මගින් තහවුරු කිරීමට උත්සාහ ගෙන ඇත්තේ,
    (1) සත්ත්ව ජාතීන්ට වඩා මිනිසා උසස් වන බවයි.
    (2) සත්ත්ව ජාතීන් අතර පවත්නා ලිංග නානත්වය මානව වර්ගයා අතරට ද පැමිණ චතුර් වර්ණය ප්‍රභවය වූ බවයි.
    (3) චතුර් වර්ණය පදනම් කරගෙන කරනු ලබන වර්ගීකරණය යුක්ති සහගත නො වන බව යි.
    (4) සත්ත්ව සංහතිය අතර මෙන් ම මානව සංහතිය තුළ ද ස්වජාතිමය ලිංග විශේෂතා ඇති බව යි.
    (5) උපත පදනම් කරගෙන මිනිස් වර්ගයා උස් - පහත් වශයෙන් වර්ග කළ හැකි බව යි.

04. ප්‍රාග් වෛදික යුගයේ පැවැති **මූලික ආගමික පිළිවෙතක්** වූයේ,
    (1) ඊශ්වර වන්දනයයි.
    (2) සති පූජාවයි.
    (3) ජගදාත්මය සමඟ එක්වීමට පිළිවෙත් පිරීමයි.
    (4) ජගන්මාතා වන්දනයයි.
    (5) බ්‍රහ්ම සහව්‍යතාවට පත්වීමට පුද පූජා පැවැත්වීමයි.

05. වෛදික ඉගැන්වීම්වලට අනුව ස්වාමිපුරුෂයා මිය ගිය පසු **බිරිඳ විසින් ඉටු කළ යුතු උසස් ම පරිත්‍යාගය** ලෙස සලකන ලද්දේ,
    (1) තමන් සතු සියලු වස්තුව වැය කොට ස්වාමියා වෙනුවෙන් යාග හෝම පැවැත්වීමයි.
    (2) බ්‍රාහ්මණ සම්ප්‍රදායානුකූල පුද පූජා පවත්වමින් දරුවන් රැකබලා ගැනීමයි.
    (3) දිවි ඇතිතාක් අවිවාහකව සිටිමින් ස්වාමියාගේ ඥාති කුලවලට දාසියක ලෙස සේවය කිරීමයි.
    (4) තම වැඩිමහල් පුතු යටතේ මෙහෙකාර සේවයේ යෙදීමයි.
    (5) ස්වාමියාගේ මළ සිරුර දැවෙන, දර සෑයට පැන ජීවිතය පූජා කිරීමයි.

06. බ්‍රාහ්මණ සම්ප්‍රදාය බුද්ධකාලීන භාරතීය කාන්තාවන්ගේ සාමාජික, ආර්ථික, දේශපාලනික මෙන් ම ආගමික නිදහස ද අහිමි කොට තිබූ බව වෛදික සාහිත්‍යයෙන් මෙන් ම බෞද්ධ මූලාශ්‍රයයන්ගෙන් ද පැහැදිලි වේ. එහෙත් ආධ්‍යාත්මික විමුක්තිය සඳහා **ස්ත්‍රීත්වය බාධාවක් නො වන** බව බුදුසමය පෙන්වා දෙයි. ඒ බව තහවුරු වන්නේ,
    (1) ථේරී ගාථාවල දක්වෙන භික්ෂුණීන්ගේ ප්‍රකාශවලිනි.
    (2) මවක් වශයෙන් වන්දනීය තත්ත්වයක් කාන්තාවට හිමිකර දීමෙනි.
    (3) බිරිඳක් වශයෙන් කාන්තාවගේ අයිතිවාසිකම් තහවුරු කර තිබීමෙනි.
    (4) බිරිඳ ස්වාමිපුරුෂයාගේ හොඳ ම මිතුරිය ලෙස හඳුන්වා දීමෙනි.
    (5) කාන්තාවන් ඒ ඒ තන්හි දී විචක්ෂණශීලී ව ක්‍රියා කරන බව බුදුරදුන් දේශනා කිරීමෙනි.

EXAMMOOD.LK

07. භාරතීය ආගමික චින්තනය තුළ ක්‍රමික ව විකාශයට පත් වූ ප්‍රධාන ආගමික සම්ප්‍රදාය දෙක වූයේ බ්‍රාහ්මණ සම්ප්‍රදාය හා ශ්‍රමණ සම්ප්‍රදායයි. මෙයින් **ශ්‍රමණ සම්ප්‍රදායයෙහි** අනන්‍යතා ලක්ෂණයක් වන්නේ,
   (1) බාහිර පුද පූජා මගින් විමුක්තිය ලද හැකියැයි විශ්වාස කිරීම ය.
   (2) ඥාන මාර්ගය අනුගමනය කොට තමා විසින් ම විමුක්තිය ලබාගත යුතු වීම ය.
   (3) දෙවියන් හා මිනිසුන් අතර සම්බන්ධීකාරක පූජකයකු පිළිගැනීම ය.
   (4) වේදය වැනි ශුද්ධ ග්‍රන්ථ පිළිගැනීම ය.
   (5) මිනිසුන් අතර කුලභේදය තිබිය යුතුයැයි පිළිගැනීම ය.

08. බුද්ධකාලීන භාරතයේ විවිධ ජීවන වෘත්තීන් පැවැති බවට සාධක හමුවේ. මෙහි ලා සාත්තුනායකයන් ගැල් සිය ගණන් යොදවා වෙළදාමෙහි යෙදීම ද, කොසඹෑ නුවර, පැලලුප් නුවර වැනි සුප්‍රකට වෙළඳ නගර පිළිබඳ තොරතුරු හමුවීම ද, භාරුකච්ඡ වැනි ප්‍රධාන වරායන් ඔස්සේ නැව් මගින් **භාණ්ඩ ආයාත - නිර්යාත කිරීම ද** වැනි සාධක මගින් ප්‍රකට කෙරෙන්නේ,
   (1) බුද්ධකාලීන භාරතයේ දියුණු නගර පැවැති බවයි.
   (2) බුද්ධකාලීන භාරතයේ භාණ්ඩ ප්‍රවාහනයට ගැල් බහුල ව භාවිත කළ බවයි.
   (3) බුද්ධකාලීන භාරතය වාණිජකරණයට ලක් වී පැවැති බවයි.
   (4) නැව් මගින් භාණ්ඩ ආයාත - නිර්යාත කළ බවයි.
   (5) බුද්ධකාලීන භාරතයේ විරැකියාව අවම වූ බවයි.

09. සමාජ පරිණාමය පිළිබඳ බෞද්ධ විග්‍රහය ඉදිරිපත් කරන **දීඝනිකායේ අග්ගඤ්ඤ සූත්‍රය**, සමකාලීන ව භාරතයේ පැවැති සියලු ආගමික සම්ප්‍රදායවල ඉගැන්වීම්වලට වෙනස් වූ ආකල්පයක් ගනී. එම විග්‍රහයට අනුව **සමාජ පරිණාමය** සිදු වී ඇත්තේ,
   (1) කර්මානුරූපීවයි.
   (2) හේතු ප්‍රත්‍ය රහිතවයි.
   (3) දේව නිර්මාණයක් ලෙසයි.
   (4) හේතුඵලවාදීවයි.
   (5) නියති - පරිණාමයක් ලෙසයි.

10. භෞතික සම්පත් හා මානව සම්පත් ඵලදායී ලෙස **කළමනාකරණය කිරීම** සංවර්ධනයේ අත්‍යවශ්‍ය සාධකයක් ලෙස බුදුසමය පිළිගනියි. ධනවර්ධන මහතා මෙම බෞද්ධ උපදේශයට අනුව උත්සාහයෙන් කුඩා ව්‍යාපාරයක් ආරම්භ කෙළේ ය. එයින් ලැබූ ආදායමෙන් වැඩි කොටසක් තම ව්‍යාපාරයේ සංවර්ධනය උදෙසා ද, තවත් කොටසක් තැන්පතු සඳහා ද වෙන් කළ ඔහු නිසි කලට සේවක වැටුප් ගෙවීම, බැංකු ණයකර පියවීම, ආදායමට සරිලන පරිදි ජීවන රටාව සකස් කර ගැනීම වැනි ආර්ථික ක්‍රියාකාරකම් විධිමත් ව සකස් කර ගත්තේ ය. මේ නිසා ධනවර්ධන මහතා ණය බරක් නොමැති ව සිය ව්‍යාපාරයත්, පවුල් ජීවිතයත්, සමාජ ජීවිතයත් පවත්වා ගත්තේ ය. මෙයින් ගම්‍යමාන වන්නේ ධනවර්ධන මහතා,
   (1) නිෂ්පාදන කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අනුගමනය කළ බවයි.
   (2) පිරිස් කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අනුගමනය කළ බවයි.
   (3) කාල කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අනුගමනය කළ බවයි.
   (4) ගැටලු කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අනුගමනය කළ බවයි.
   (5) මූල්‍ය කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අනුගමනය කළ බවයි.

11. "ස්වාමිපුරුෂයා සිය බිරිඳ සම්මානනයට ලක් කළ යුතු ය. අවමන් නො කළ යුතු ය. බිරිඳ හැර වෙනත් කතුන් නො පැතිය යුතු ය. නිවසෙහි ආධිපත්‍යය පවරා දිය යුතු ය. බිරිඳ කැමැති ආභරණ ආදිය ශක්ති ප්‍රමාණයෙන් ලබා දිය යුතු ය." සිඟාලෝවාද සූත්‍රයේ විස්තර වන **මෙම යුතුකම් ඉටු කිරීම** මගින් ප්‍රකට වනුයේ,
   (1) පවුල් ඒකකය තුළ බිරිඳට ගෞරවණීය තත්ත්වයක් හිමිකර දී ඇති බවයි.
   (2) මවක් වශයෙන් කාන්තාව පූජනීයත්වයට පත්කොට ඇති බවයි.
   (3) පුරුෂයාට මෙන් ම කාන්තාවට විමුක්තිය සඳහා සමාන හැකියාවක් ඇති බවයි.
   (4) පවුල තුළ බිරිඳ ස්වාමියාට වඩා උතුම් බවයි.
   (5) බිරිඳත් සැමියාත් සමාන තත්ත්වයකින් සැලකිය යුතු බවයි.

12. පොළොවේ වසන සියලු ම සතුන් ඝාතනය කොට එක ම මස් ගොඩක් කෙළේ වී නමුත් ඉන් කිසිදු පාපයක් සිදු **නො වන** බව ප්‍රකාශ කළේ,
   (1) නිගණ්ඨනාතපුත්ත ය.
   (2) පූරණ කස්සප ය.
   (3) අජිත කේසකම්බලී ය.
   (4) මක්ඛලී ගෝසාල ය.
   (5) සංජය බෙල්ලට්ඨිපුත්ත ය.

EXAMMOOD.LK
EXAMMOOD.LK

13. සත්ත්වයන්ගේ කෙලෙසීම හෝ විශුද්ධිය පිණිස හේතු-ඵල සම්බන්ධතාවක් නැත. තමන්ගේ හෝ අනුන්ගේ හෝ යහපත පිණිස කළයුතු දෙයක් නැත. සියලු සත්ත්වයෝ වීර්යය, බලය, ආත්ම ශක්තිය රහිතයෝ ය. මෙයින් ඉගැන්වෙන **ආගමික චින්තාව** හඳුන්වන්නේ,
(1) පරම අවිහිංසාවාදය ලෙසයි.
(2) පුබ්බේකතහේතුවාදය ලෙසයි.
(3) අහේතු අප්‍රත්‍යයවාදය ලෙසයි.
(4) උච්ඡේදවාදය ලෙසයි.
(5) අමරාවික්ඛේපවාදය ලෙසයි.

14. කෝසල, මගධ, වත්ස හා අවන්ති යන රාජාණ්ඩු බුද්ධකාලීන ව භාරතයේ පැවැති ප්‍රමුඛ රාජ්‍යයන් ලෙස සැලකේ. මෙම රාජ්‍යවලට අයත් ප්‍රසිද්ධ නගර රාශියක් පැවැති බව ද බෞද්ධ මූලාශ්‍රයයන්හි දැක්වේ. පහත දැක්වෙන නගර අතුරෙන් **කෝසල රාජ්‍යයට අයත්** නගරයක් වන්නේ,
(1) රජගහ නුවර ය.
(2) විශාලා මහනුවර ය.
(3) පැලලුප් නුවර ය.
(4) සාකේත නුවර ය.
(5) කුසිනාරා නුවර ය.

15. සුද්ධෝදන - අමිතෝදන ආදී පුද්ගල නාමයන්ට "ඕදන" යන්න යෙදීමෙන් භාරතීය ජනතාවගේ ප්‍රධාන ආහාරය "බත" වූ බව ගම්‍ය වේ. සුද්ධෝදන රජතුමා සී සෑමේ ජාතික උත්සවයට සහභාගී වූ බවත්, එම වප්මඟුලේ දී සිද්ධාර්ථ කුමාරයා දඹරුක් සෙවණේ ආනාපානසති භාවනාවේ යෙදුණු බවත්, බෞද්ධ මූලාශ්‍රයවල සඳහන් වේ. භික්ෂූන්ගේ සිවුර මගධ කුඹුරු යායේ ආකෘතිය අනුව සකසා ගන්නට බුදුරදුන් උපදෙස් දුන් බවත්, කසීභාරද්වාජ සූත්‍රයේ දැක්වෙන ආකාරයට කසීභාරද්වාජ වැනි බ්‍රාහ්මණයන් පවා සී සෑමේ යෙදී සිටි බවත් ප්‍රකට ය. මේ **සමස්ත ඡේදයෙන් පැහැදිලි වන්නේ,**
(1) සුද්ධෝදන රජු සී සෑමේ නායකත්වය ගත් බවයි.
(2) වප්මඟුල් දා සිදුහත් බෝසතුන් ආනාපානසති භාවනාවේ යෙදී සිටි බවයි.
(3) බමුණන් පවා කෘෂි කර්මාන්තයෙහි යෙදුණු බවයි.
(4) කුඹුරේ ආකෘතියට අනුව භික්ෂු චීවරය සකස් වූ බවයි.
(5) බුද්ධකාලීන භාරතයේ දියුණු කෘෂි-ආර්ථික රටාවක් පැවැති බවයි.

16. "සත්ත්වයා සහ ලෝකය සර්වබලධාරී දෙවියකු විසින් **මවා පාලනය කරනු ලැබේ.**" යන ප්‍රකාශයෙන් කියැවෙන ආගමික ඉගැන්වීම හඳුන්වනු ලබන්නේ,
(1) ඊශ්වර නිර්මාණවාදය යනුවෙනි.
(2) අහේතු අප්‍රත්‍යවාදය යනුවෙනි.
(3) නියතිවාදය යනුවෙනි.
(4) පරිණාමවාදය යනුවෙනි.
(5) ශාස්වතවාදය යනුවෙනි.

17. පුද්ගල පෞරුෂ සංවර්ධනයට හා ස්වාධීන චින්තනයට හානි පමුණුවන පුබ්බේකතහේතුවාදය, අහේතු අප්‍රත්‍යයවාදය, දේව නිර්මාණවාදය වැනි ඉගැන්වීම් **ප්‍රතික්ෂේප කිරීමට** බුදු සමය ඉදිරිපත් කරන්නේ,
(1) කර්මවාදයයි.
(2) හේතුඵලවාදයයි.
(3) විභජ්ජවාදයයි.
(4) අනාත්මවාදයයි.
(5) පරිණාමවාදයයි.

18. සියලු රටවැසියන්ට පමණක් නොව පක්ෂීන්ට, සිවුපාවුන්ට පවා දැහැමි රැකවරණය සැලසීම, සිය රටෙහි අධාර්මික ක්‍රියාවලට ඉඩ නො තැබීම, දිළිඳු භාවය නැති කොට ආර්ථික සංවර්ධනය පිණිස කටයුතු කිරීම, සිය රටෙහි වෙසෙන වියත් විශාරද මහණ බමුණන්ගෙන් උපදෙස් ලබාගෙන දැහැමින් රට පාලනය කිරීම යන කරුණු ඇතුළත් වන **බෞද්ධ දේශපාලන මූලධර්මය** හඳුන්වන්නේ,
(1) සතර සංග්‍රහ වස්තු නමිනි.
(2) සප්ත අපරිහානීය ධර්ම නමිනි.
(3) දස සක්විති වත් නමිනි.
(4) දසරාජ ධර්ම නමිනි.
(5) දස පින්කිරිය වත් නමිනි.

19. යම් පාලකයකු ධර්මයට හා නීතියට වඩා සිය කැමැත්ත අනුව ඥාතීන්ට සංග්‍රහ කිරීම, හිතමිත්‍රාදීන්ට අවනීතියට වැඩ කරන්නට ඉඩ දීම, විරුද්ධ මත දරන්නන් හිංසාවට ලක් කිරීම, තම පාලනය ගිලිහේ ය යන බිය නිසා හෝ වෙනත් හේතූන් නිසා බියපත් ව වැරදි තීරණ ගැනීම, මුළා වී නුසුදුසු දෑ කිරීම ආදී ජනතා හිතවාදයෙන් තොර පාලනයක් ගෙන යයි නම්, **බෞද්ධ දේශපාලන මූලධර්මවලට** අනුව එවැනි පුද්ගලයකු හැඳින්විය හැක්කේ,
(1) සතර කර්මක්ලේශයෙන් යුතු පාලකයකු ලෙසිනි.
(2) චතුර්විධ මිත්‍ර ප්‍රතිරූපකයන් ඇසුරු කරන පාලකයකු ලෙසිනි.
(3) සතර සම්‍යග්ප්‍රධානයෙන් කටයුතු නො කරන පාලකයකු ලෙසිනි.
(4) සතර අගතියෙන් යුතු පාලකයකු ලෙසිනි.
(5) චතුර්විධ සුඛය නො දන්නා පාලකයකු ලෙසිනි.

20. පහතින් දැක්වෙන්නේ "කල්‍යාණ මිත්‍ර" දහම් පාසලේ මාසික රැස්වීමේ දී "හිංසනය පිටු දකිමු" මැයෙන් අහිංසක නමැති ශිෂ්‍යයා විසින් ඉදිරිපත් කළ කථාවෙන් කොටසකි.

"හිංසනය වනාහි මිනිස්කමට නො ගැළපෙන නපුරු විපාක ලබා දෙන පාප ක්‍රියාවක්. අප වගේම ලෝකයේ ඉන්න සියලු ම සත්ත්වයෝ දඬුවමට, මරණයට බයයි. දුකට අකමැතියි. සැප විඳින්නට කැමතියි. ඒ නිසා අප තුළ ඇති මේ ආකල්පයෙන් සියලු සත්ත්වයන් දෙස බැලිය යුතුයි. මේ අවබෝධය තිබෙන මිනිසුන් කවදාවත් අනුන්ට හිංසා කරන්නවත්, අනුන් නසන්නවත් හිතන්නේ නැහැ" මේ කථාවෙන් කියැවෙන **බෞද්ධ සදාචාර මූලධර්මය** හඳුන්වන්නේ,

(1) ආත්ම හිංසනය වශයෙනි.
(2) ආත්ම සංවරය යනුවෙනි.
(3) ආත්ම දමනය වශයෙනි.
(4) පරාර්ථ චර්යාව යනුවෙනි.
(5) අත්තූපනායික ධර්ම පර්යාය වශයෙනි.

21. "තෘප්තිමත් නො වීම සාමාන්‍ය මිනිස් ස්වභාවයකි. බොහෝ බලය හා සම්පත් ඇති රජු ද, බලවත්තු ද, පොහොසත්තු ද තෘප්තිමත්භාවයට පත්වීමකින් තොරව ම මරණයට පත්වෙති. එසේ වන්නේ මිනිසා තෘෂ්ණාවට දාස වන බැවිනි. මේ තත්ත්වය අවබෝධ කර ගත් බෞද්ධයා ආශාවන් පසු පස හඹා යාම වෙනුවට ආශාවන් අඩුකර ගැනීමට උත්සාහ ගනියි. අතෘප්තිකර ස්වභාවය සමනය කර ගෙන තෘප්තිමත් සරල දිවි පෙවෙතකට හුරු වෙයි." ඉහත ඡේදයෙන් ගම්‍ය වන **බෞද්ධ සදාචාර ධර්මය** හැඳින්වීමට වඩාත් සුදුසු වචනය වන්නේ,

(1) අල්පේච්ඡතාව ය.
(2) මහේච්ඡතාව ය.
(3) බහුකිච්චතාව ය.
(4) අල්පකෘත්‍යතාව ය.
(5) සුභරතාව ය.

22. "පංචශිඛ" නම් ගාන්ධර්වයා බුදුරදුන් වෙත පැමිණ බේලුව පණ්ඩු වීණාව වාදනය කරමින් සිය පෙම්වතිය වෙනුවෙන් ප්‍රබන්ධිත ගී පෙළක් ගායනා කෙළේ ය. මෙහි දී බුදුරජාණන් වහන්සේ පංචශිඛගේ ගායන - වාදන දක්ෂතාව ඇගයීමට ලක් කළහ. **මෙම සිද්ධිය සඳහන් වන්නේ,**

(1) මහාමංගල සූත්‍රයේ ය.
(2) සක්කපඤ්හ සූත්‍රයේ ය.
(3) සිඟාලෝවාද සූත්‍රයේ ය.
(4) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ ය.
(5) මහාපරිනිබ්බාණ සූත්‍රයේ ය.

23. ගෘහස්ථ ජීවිතය තුළ සදාචාරාත්මක **සීමාව ඉක්මවා කම්සැප නො විඳිය යුතු** බව උගන්වන ශික්ෂාපදය වන්නේ,

(1) සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි යනුවෙනි.
(2) අබ්‍රහ්මචරියා වේරමණී සික්ඛාපදං සමාදියාමි යනුවෙනි.
(3) කාමේසුමිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි යනුවෙනි.
(4) අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි යනුවෙනි.
(5) පිසුනාවාචා වේරමණී සික්ඛාපදං සමාදියාමි යනුවෙනි.

24. සිඟාලෝවාද සූත්‍රයේ දැක්වෙන **උඩ දිසාවෙන්** නියෝජනය වන්නේ,

(1) දෙමවුපියන් ය.
(2) ගුරුවරුන් ය.
(3) ස්වාමිපුරුෂයන් ය.
(4) මහණ බමුණන් ය.
(5) සේවා දායකයන් ය.

25. "අනණ" සූත්‍රයේ විස්තර වන චතුර්විධ සුඛයන් අතර "**භෝග සුඛ**" යනුවෙන් අදහස් කරන්නේ,

(1) භව භෝග සම්පත් බහුල ව රැස්කර ගැනීමෙන් ලබන සතුටයි.
(2) භෝග වගා කිරීමෙන් ලබන සතුටයි.
(3) දැහැමිව භෝග සම්පත් උපයා ගැනීමෙන් ලබන සතුටයි.
(4) නිවැරදි දිවිපෙවෙතක් ගත කිරීමෙන් ලබන සතුටයි.
(5) තමා සතු සම්පත් නිසි පරිදි පරිභෝග කිරීමෙන් ලබන සතුටයි.

26. "සෝපාක" ඉපදී මාස හතරකින් ඔහුගේ පියා මිය ගියේ ය. ඉන්පසු ඔහු පෝෂණය කරන ලද්දේ සුළු පියා විසිනි. වයස හතේ දී, තම පුතු සමග කළහ කිරීම නිසා කෝපයට පත් සුළු පියා සෝපාකගේ දෙ අත් පිටුපසට තබා බැඳ අමු සොහොනට ගෙන ගොස් මළමිනියකට තබා ගැටගැසී ය. මධ්‍යම රාත්‍රියේ දී බියට පත් සෝපාක කිසිවකුගෙන් හෝ පිහිටක් ඉල්ලා හඬමින් කෑ ගැසී ය. මේ සිද්ධිය දිවැසින් දුටු බුදුපියාණන් වහන්සේ සෝපාකට පිහිට වී දුකින් මුදවා ගත්හ. මේ සිද්ධියෙන් ප්‍රකට වන්නේ **බුදුරජාණන් වහන්සේ තුළ පැවැති,**

(1) මහාකාරුණික ගුණයයි.
(2) පුරිසදම්මසාරථී ගුණයයි.
(3) අරහං ගුණයයි.
(4) සත්ථාදේවමනුස්සානං ගුණයයි.
(5) මහාප්‍රඥාවයි.

EXAMMOOD.LK

27. පිරිනිවන් පෑමට ආසන්නයේ දී බුදුරජාණන් වහන්සේ භික්ෂූන් අමතා, කිසියම් භික්ෂුවකට බුදුන් - දහම් - සඟුන් කෙරෙහි හෝ මාර්ගය කෙරෙහි හෝ නිර්වාණගාමී ප්‍රතිපදාව කෙරෙහි යම් සැකයක් විමතියක් ඇත්නම් විමසන්නැ'යි ද, නො විචාරා සිට පසුව පසුතැවිලි නො වන්නැ' යි ද වදාළහ. තෙ වරක් මෙසේ ප්‍රකාශ කරද්දීත් භික්ෂූන් නිහඬ ව සිටි බැවින් තමන් වහන්සේ කෙරෙහි ඇති ගෞරවය නිසා යමෙකු ප්‍රශ්න නො කරන්නේ නම් යහළුවකු මගින් හෝ කරුණු විමසා දැනගන්නැ'යි අවවාද කළහ. මෙයින් ගම්‍ය වන්නේ **බුදුරදුන් තුළ පැවැති,**
(1) ධර්ම ප්‍රචාරයට තිබූ දැඩි කැමැත්තයි.
(2) විශිෂ්ට ශාස්තෘත්වයයි.
(3) ප්‍රශ්න විසඳීමට තිබූ අසමසම හැකියාවයි.
(4) තාදී ගුණයයි.
(5) මහාකාරුණික ගුණයයි.

28. "මේ දහම් අකුසල් ය. මේ දහම් වරද සහිත ය. මේ දහම් නුවණැත්තන් විසින් ගරහන ලද්දේ ය. මේ දහම් පිළිපැදීමෙන්, සමාදන් වීමෙන්, අවැඩ පිණිස, දුක් පිණිස, පවත්නාහ'යි යම් කලෙක තෙපි තුමූ ම දැනගන්නාහු නම් එය දුරු කරව්" යනුවෙන් දක්වෙන **බුද්ධානුශාසනාවෙන්** අවධාරණය කෙරෙන්නේ,
(1) බුදු දහම කාලාම සූත්‍රගත 'කුසල්' පමණක් කිරීම අගය කළ බවයි.
(2) බුදු දහම නුවණැත්තන් විසින් ගරහන ලද දේ අගය කළ බවයි.
(3) බුදු දහම නිදහස් චින්තනය අගය කළ බවයි.
(4) බුදු දහම කිසිවකුට අවැඩ පිණිස, දුක් පිණිස හේතු නො වන දේ කිරීම අගය කළ බවයි.
(5) බුදු දහම අත්තනෝමතික පුද්ගල චින්තනය උසස් යැයි අගය කළ බවයි.

29. බුදුරජාණන් වහන්සේ අපමණ දෙව් මිනිසුන්ගේ පැසසුම් - ගුණ ගායනාවන්ට මෙන් ම චිංචිමාණවිකාව, සුන්දරී පරිබ්‍රාජිකාව, අක්කෝසක භාරද්වාජ වැන්නවුන්ගේ නින්දා - අපහාස - පරිභවවලට ද ලක් වූ ශාස්තෘවරයෙකි. අසදෘශ මහා දානයන්ගෙන් වරෙක පිදුම් ලැබූ උන්වහන්සේට, වරෙක කටුක යවහාලින් යැපීමට ද සිදු විය. මේ කිසිම අවස්ථාවක දී උද්දාමයට හෝ කම්පාවට පත් නො වූ උන්වහන්සේ මේ සියල්ල මැදහත් ව විඳ දරා ගත්හ. බුදු රදුන් තුළ පැවැති මෙකී **උත්තරීතර ගුණය** හඳුන්වනු ලබන්නේ,
(1) කරුණා ගුණය යනුවෙනි.
(2) මෙත්තා ගුණය යනුවෙනි.
(3) අරහං ගුණය යනුවෙනි.
(4) තාදී ගුණය යනුවෙනි.
(5) භගවා ගුණය යනුවෙනි.

30. බුද්ධකාලීන භාරතයේ ශ්‍රමණ - බ්‍රාහ්මණ යනුවෙන් ප්‍රධාන ආගමික සම්ප්‍රදාය දෙකක් පැවතුනි. බුදුරජාණන් වහන්සේ ශ්‍රමණ සම්ප්‍රදායේ ඇතැම් චර්යා ලක්ෂණ සංස්කරණය කරගනිමින් ද, නව අංග හඳුන්වා දෙමින් ද උසස් ප්‍රතිපත්ති හා පරමාර්ථ සහිත ව පරමාදර්ශි සමාජයක් ලෙස **බෞද්ධ භික්ෂු සංවිධානය සකස් කළහ.** මෙකී භික්ෂු සංස්ථාවේ ශ්‍රමණයන් හඳුන්වන ලද්දේ,
(1) බාහිතපාපී ශ්‍රමණ යනුවෙනි.
(2) අචේලක ශ්‍රමණ යනුවෙනි.
(3) ඒකසාටක ශ්‍රමණ යනුවෙනි.
(4) මුණ්ඩක ශ්‍රමණ යනුවෙනි.
(5) ශාක්‍යපුත්‍ර ශ්‍රමණ යනුවෙනි.

31. පස්වග මහණුන්ගෙන් ආරම්භ වූ බෞද්ධ සංඝ සංවිධානයෙහි විකාශයත් සමඟ විවිධ පුද්ගලයන් රෝගාබාධවලට උසස් ප්‍රතිකාර ලබා ගැනීම, අසරණ බවින් මිදීම, සුව පහසුවෙන් ජීවත් වීම, සමාජයේ ගරු බුහුමන් ලබා ගැනීම වැනි පෞද්ගලික අවශ්‍යතා ඉටු කර ගැනීමට සසුන්ගත වූ බව විනය පිටකයෙන් පැහැදිලි වේ. එහෙත් බුදුරදුන්ගේ ඇගයීමට අනුව බෞද්ධ පබ්බජ්ජාවේ **මූලික පරමාර්ථය** විය යුත්තේ,
(1) සියලු සාංසාරික දුකින් මිදීමයි.
(2) මරණින් මතු සුගතිගාමී වීමයි.
(3) කිසිවකුට බරක් නොවී පහසුවෙන් ජීවත් වීමයි.
(4) පිණ්ඩපාතයෙන් ලැබෙන දෙයකින් යැපීමයි.
(5) සමූහයක් ලෙස සමගියෙන් ජීවත් වීමයි.

32. බෞද්ධ සංඝ සංවිධානය ක්‍රමික ව විකාශය වෙද්දී කාලීන අවශ්‍යතා මත පැන නැගුණු ගැටලුවලට විසඳුම් වශයෙන් පැවිද්ද සම්බන්ධ ව යම් යම් සීමා - නියමයන් පණවන්නට බුදුරදුන්ට සිදු විය. මහාවග්ගපාළි - මහාඛන්ධකයේ එවැනි පැනවීම් රැසක් දක් වේ. දිනක් බුදුරජාණන් වහන්සේ සුදොවුන් රජුගේ මාලිගයට වැඩම කළ අවස්ථාවේ යසෝධරාවගේ ඉල්ලීම පිට, බුදුරදුන්ගෙන් පිය උරුමයේ දායාද ඉල්ලමින් කුඩා රාහුල පුතු බුදුරදුන් පසුපස ගියේ ය. පසුව සැරියුත් හිමියන් ලවා රාහුල කුමරු පැවිදි කරවූහ. මේ පුවත අසා කම්පනයටත්, දුකටත් පත් වූ සුද්ධෝදන රජු වහා බුදුරදුන් වෙත පැමිණ පැවිදි කිරීම සම්බන්ධයෙන් සීමා පනවන ලෙස වරයක් ඉල්ලා සිටියේ ය. **ඒ සීමා නියමය** වන්නේ,
(1) අඩු වයසේ කුඩා දරුවන් පැවිදි නො කළ යුතුය යන්නයි.
(2) දෙමාපිය අවසරය නො ලත් දරුවන් පැවිදි නො කළ යුතුය යන්නයි.

(3) රාජකීය පවුල්වල දරුවන් පැවිදි නො කළ යුතුය යන්නයි.
(4) ස්ව කැමැත්ත නො විමසා කුල දරුවකු පැවිදි නො කළ යුතුය යන්නයි.
(5) ඥාති පවුල්වල දරුවන් පැවිදි නො කළ යුතුය යන්නයි.

33. "ඒහි භික්ඛු" භාවයෙන් ආරම්භ වූ බෞද්ධ භික්ෂු - භික්ෂුණී උපසම්පදාව ක්‍රම අටක් දක්වා සංවර්ධනය විය. එකී උපසම්පදා ක්‍රම අට අතුරෙන් **"අට්ඨවාචික"** උපසම්පදා ක්‍රමය නමින් හඳුන්වන්නේ,
(1) ගරුධර්ම අටක් පිළිගැනීමෙන් භික්ෂුණීන්ට ලබා දුන් උපසම්පදාවයි.
(2) අවවාද පිළිගැනීමෙන් සිදුකළ උපසම්පදාවයි.
(3) උභතො සංඝයා ඉදිරියේ "ඤත්තිචතුත්ථකම්ම" විනය කර්මයෙන් සිදු කළ උපසම්පදාවයි.
(4) තිසරණය සරණ ගැන්වීමෙන් ලබා දුන් උපසම්පදාවයි.
(5) දූතයකු මගින් ලබා දුන් උපසම්පදාවයි.

34. ජෛනාගමික ශ්‍රමණ ප්‍රතිපත්තීන් ද, මහජනතාවගේ ඉල්ලීම් ද සැලකිල්ලට ගත් බුදුරජාණන් වහන්සේ සංචාරක - ධර්ම ප්‍රචාරක ජීවිතයක් ගත කළ භික්ෂු සංඝයාට භාරතයේ එක් සෘතුවක දී සංචාරක ජීවිතය අතහැර ආරාමික ව වාසය කරන්නට අනුදැන වදාළහ. එහි දී පිළිපැදිය යුතු වත් පිළිවෙත් ද නියම කළහ. බුදුරදුන් **අනුමත කළ එම පිළිවෙත** වන්නේ,
(1) උපෝසථ විනය කර්මයයි.
(2) ආපත්ති ආරෝචනයයි.
(3) ප්‍රාතිමෝක්ෂය දේශනා කිරීමයි.
(4) වස්සාවාසයයි.
(5) පිරිවෙස් පිරීමයි.

35. බුදුරජාණන් වහන්සේ පැවිදි සංවිධානය ඇති කර නොබෝ කලකින් භික්ෂූන් අමතා "බොහෝ දෙනාට හිත පිණිස ද, සැප පිණිස ද, ලොවට අනුකම්පා පිණිස ද, දෙව් මිනිසුන්ට වැඩ පිණිස ද, හිත පිණිස ද, සැප පිණිස ද චාරිකාවේ හැසිරෙව්. දෙදෙනෙක් එක් මඟකින් නො යව්. මුල-මැද-අග යහපත් වූ අර්ථවත් වූ දහම් දෙසව්, පිරිසිදු වූ බ්‍රහ්මචරියාව ප්‍රකාශ කරව්." යනුවෙන් වදාරා තමන් වහන්සේ ද දහම් දෙසනු පිණිස උරුවෙල් දනව්වෙහි සේනානී නියම් ගමට වැඩම කළහ. මෙසේ පිටත් කොට යැවූ **ප්‍රථම ධර්ම දූත කණ්ඩායමට** අයත් වූයේ,
(1) පස් නමකි.
(2) පනස් හතර නමකි.
(3) පනස් පස් නමකි.
(4) හැට නමකි.
(5) හැට එක් නමකි.

36. අජාසත් රජුගේ අනුග්‍රහය හා ආරක්ෂාව ඇති ව මහා කාශ්‍යප මහරහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් ප්‍රථම ධර්ම සංගීතිය, බුදුරදුන් පිරිනිවී තුන් මසකින් පැවැත් වූ බව ශාසන ඉතිහාසයෙහි දක් වේ. මෙම ධර්ම සංගායනාවට හේතු වූ ඇතැම් කරුණු බුද්ධ කාලය තුළ දී ම වර්ධනය වෙමින් පැවැති බවට සාති - අරිට්ඨ - කෝකාලික - බහුභාණ්ඩික - ථුල්ලතිස්ස වැනි භික්ෂූන්ගේ ආකල්ප හා ක්‍රියාකාරකම් නිදසුන් ය. එහෙත් **ප්‍රථම ධර්ම සංගීතියට** අදාළ මූලික හේතුව වශයෙන් දක්වෙන්නේ,
(1) දේවදත්ත හිමියන්ගේ ක්‍රියා කලාපයයි.
(2) ධර්මධර - විනයධර භික්ෂූන්ගේ අර්බුදයයි.
(3) ඡන්න භික්ෂුවගේ විෂමාචාර පැවැත්මයි.
(4) සාති භික්ෂුවගේ විඥානවාදයයි.
(5) සුභද්‍ර භික්ෂුවගේ වගකීම් රහිත ප්‍රකාශයයි.

37. ජෛන භක්තිකයකු ව සිටි අශෝක රජු මහා රණකාමී පාලකයකු විය. කාලිංග යුද්ධයෙන් ජයග්‍රහණය ලැබූ ඔහු එහි දී සිදු වූ අතිවිශාල මිනිස් ඝාතන පිළිබඳ ව පසුතැවිල්ලටත්, කළකිරීමටත් පත් වූ බව අශෝකගේ "ෂාබාෂ්ගර්" සෙල්ලිපියෙහි දක් වේ. පසුව අශෝක රජු බුදු දහම වැළඳගෙන "ධර්මාශෝක" බවට පත් විය. මෙහි දී ධර්මාශෝක බෞද්ධ අධිරාජයාට අවශ්‍ය **මාර්ගෝපදේශකත්වය සපයන ලද්දේ,**
(1) මොග්ගලීපුත්තතිස්ස තෙරුන් විසිනි.
(2) අනුරුද්ධ තෙරුන් විසිනි.
(3) මහාකාශ්‍යප තෙරුන් විසිනි.
(4) උපාලි තෙරුන් විසිනි.
(5) නිග්‍රෝධ සාමණේරයන් විසිනි.

38. ප්‍රාග් බෞද්ධ ලංකාවේ ඉන්දියානු සම්භවයක් සහිත ආගමික සම්ප්‍රදායන් ද, ශ්‍රී ලාංකික අනන්‍යතා සහිත ඇදහීම් හා විශ්වාසයන් ද පැවැති බවට සාධක හමුවේ. පණ්ඩුකාභය රජතුමා මෙකී සියලු ම ආගම් විෂයයෙහි සමානත්වයෙන් සැලකූ බව ද වාර්තා වේ. එකල ලක්දිව පැවැති ප්‍රකට ආගමික විශ්වාසයක් වූයේ යක්ෂයින් ඇදහීමයි. එසේ ශ්‍රී ලාංකිකයන්ගේ ඇදහිල්ලට ලක් වූ **යක්ෂයකු** වූයේ,
(1) මණිඅක්ඛිත ය.
(2) චිත්තරාජ ය.
(3) චූලෝදර ය.
(4) විභීෂණ ය.
(5) වලවාමුඛී ය.

EXAMMOOD.LK

39. මහින්දාගමනයෙන් පසු ශ්‍රී ලාංකික ජන ජීවිතය බෞද්ධ සාරධර්මවලින් පෝෂණය විය. කරුණාව, මෛත්‍රිය, අවිහිංසාව, පරෝපකාරය වැනි ගුණධර්ම මෙරට වැසියන්ගේ හදවත් තුළ වැඩී ගියේ බුදු සමයේ ආභාසයෙනි. "මාඝාත" වැනි නීති පැනවීමෙහි ලා බලපෑවේ ද බුදු සමයයි. **"මාඝාත"** නීතිය යනුවෙන් හඳුන්වනු ලබන්නේ,
(1) මිනිස් ඝාතන තහනම් කිරීමයි.
(2) පූජෝත්සවවල දී බිලිපූජා තහනම් කිරීමයි.
(3) සත්ත්ව ඝාතනය සම්පූර්ණයෙන් ම තහනම් කිරීමයි.
(4) මිනිසුන්ට මෙන් ම සතුන්ට ද දයාවෙන් සැලකීමට පැන වූ නීතියයි.
(5) සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා!යි මෙත් වැඩීමට පැන වූ නීතියයි.

40. පැරණි භාරතයේ කීර්තිමත් බෞද්ධ විද්‍යාස්ථානයක් වූ නාලන්දාව, විශ්වවිද්‍යාලයක් ලෙස සංවර්ධනය කිරීමට **පළමුවෙන් ම රාජ්‍යානුග්‍රහය** ලබා දුන් රජතුමා වූයේ,
(1) බුද්ධගුප්ත රජු ය.
(2) චන්ද්‍රගුප්ත රජු ය.
(3) බාලාදිත්‍ය රජු ය.
(4) ශක්‍රාදිත්‍ය රජු ය.
(5) වික්‍රමාදිත්‍ය රජු ය.

41. බුදුරදුන් වෙත ඉදිරිපත් වූ විවිධ ප්‍රශ්න විසඳීම සඳහා උන්වහන්සේ චතුර්විධ ක්‍රමවේදයක් උපයෝගී කොට ගත්හ. ඇතැම් ප්‍රශ්නවලට පිළිතුරු නො දී පසෙකින් තැබූහ. බුදුරජාණන් වහන්සේ එසේ **පිළිතුරු නො දුන් ප්‍රශ්න** හැඳින්වීමට භාවිත කළ ක්‍රමය,
(1) ඒකංස ව්‍යාකරණීය ක්‍රමයයි.
(2) විභජ්ජ ව්‍යාකරණීය ක්‍රමයයි.
(3) පටිපුච්ඡා ව්‍යාකරණීය ක්‍රමයයි.
(4) අත්තජ්ඣාසය ක්‍රමයයි.
(5) ඨපනීය ක්‍රමයයි.

42. මහාවිහාරය සහ අභයගිරිය මෙරට පැවැති ප්‍රධාන බෞද්ධ අධ්‍යාපන මූලස්ථාන දෙකකි. මහින්දාගමනයෙන් පසුව මහා විහාරය ඉදිකරවන ලද්දේ දේවානම්පිය තිස්ස රජතුමන් විසිනි. **අභයගිරි විහාරය ඉදිකරවන ලද්දේ,**
(1) වට්ටගාමිණීඅභය රජු විසිනි.
(2) පණ්ඩුකාභය රජු විසිනි.
(3) දුට්ඨගාමිණී රජු විසිනි.
(4) මහාසේන රජු විසිනි.
(5) ගජබා රජු විසිනි.

43. දළදා වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කළ වකවානුවේ පටන් මේ දක්වා ම මෙරට බෞද්ධ සංස්කෘතියේ සුවිශේෂී පූජා උත්සවයක් ලෙස දළදා පෙරහැර ප්‍රකට ව පවතී. මෙම **දළදා පෙරහැර ආරම්භ කරන ලද්දේ,**
(1) දෙවනපෑතිස් රජතුමන් විසිනි.
(2) කිත්සිරිමෙවන් රජතුමන් විසිනි.
(3) වලගම්බා රජතුමන් විසිනි.
(4) විජයබාහු රජතුමන් විසිනි.
(5) කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමන් විසිනි.

44. ජපානයට බුදු සමය හඳුන්වා දීමෙන් පසු ව බෞද්ධ උත්සව රාශියක් ඇති විය. ජපන් ජන ජීවිතය පෝෂණය කිරීමෙහි ලා එම උත්සව බෙහෙවින් ඉවහල් විය. මෙම උත්සව අතර **"ඔබොන් උත්සවය"** නමින් හඳුන්වනු ලබන්නේ,
(1) මළවුන් පිදීමේ උත්සවයයි.
(2) ජනප්‍රිය මල් උත්සවයයි.
(3) බුදුරජාණන් වහන්සේගේ උපන් දිනය සමරණ උත්සවයයි.
(4) දළදා උත්සවයයි.
(5) දෙවියන් පිදීමේ උත්සවයයි.

45. තෙවන ධර්ම සංගායනාවෙන් පසු බුදුසමය හඳුන්වා දුන් රටවල් නවය අතර **"සුවණ්ණභූමිය"** ද එක් රටක් ලෙස සඳහන් වේ. සුවණ්ණභූමි යනුවෙන් අද සැලකෙන්නේ,
(1) ශ්‍රී ලංකාවයි.
(2) ටිබෙටයයි.
(3) චීනයයි.
(4) මියන්මාරය (බුරුමය)යි.
(5) කාම්බෝජයයි.

EXAMMOOD.LK

46. බුද්ධ ප්‍රතිමාව මානවරූපී ව නිර්මාණය කිරීමට පෙර ඒ සඳහා බෞද්ධ කලාකරුවා විවිධ සංකේත භාවිත කළ බවට සාක්ෂි සාංචි ස්තූපය ආශ්‍රිත කැටයම්වල දක්වේ. මෙහි ලා බුදුරජාණන් වහන්සේ නිරූපණය කිරීමට යොදාගත් **එක් සංකේතයක්** වූයේ,
(1) බෝ කොළයයි. (2) ඌර්ණරෝම ධාතුවයි. (3) සඳකඩපහණයි.
(4) වජ්‍රායුධයයි. (5) වජ්‍රාසනයයි.

47. අනුරාධපුර යුගයේ දී නිර්මිත සඳකඩපහණේ අන්තර්ගත සත්ත්ව සංකේත අතුරෙන් පොළොන්නරු යුගයේ දී ඉවත් කරන ලද සත්ත්ව සංකේතය වූයේ,
(1) ගවයා ය. (2) ඇතා ය. (3) සිංහයා ය. (4) අශ්වයා ය. (5) හංසයා ය.

48. මිහිඳු මාහිමියන්ගේ උපදෙස් අනුව ලක්දිව ඉදි වූ මුල් ම ස්තූපය වන්නේ,
(1) ගිරිහඬු සෑයයි. (2) ථූපාරාමයයි.
(3) මහියංගණ ස්තූපයයි. (4) නාගදීප ස්තූපයයි.
(5) කැලණිය ස්තූපයයි.

49. ශ්‍රී ලංකාවේ ඉපැරණි චිත්‍ර අතුරෙන් අනුරාධපුර යුගයට අයත් **බෞද්ධ සිතුවම් හමු වී ඇති ස්ථානයක්** වන්නේ,
(1) දඹුළු විහාරයයි. (2) ගල් විහාරයයි.
(3) හිඳගලයි. (4) දිඹුලාගලයි.
(5) තිවංක පිළිමගෙයයි.

50. ස්තූපය, ශ්‍රී මහා බෝධිය, දළදා වහන්සේ වැනි පූජනීය වස්තු විෂය කොටගෙන බෞද්ධ වංශ කථා සාහිත්‍යය රචනා විය. එසේම පාලි සාහිත්‍යය ආභාසයෙන් ද සිංහල සාහිත්‍යය සංවර්ධනය වූ බව පෙනේ. අගනා සිංහල සාහිත්‍ය ග්‍රන්ථයක් වූ **සද්ධර්මරත්නාවලිය** එසේ පාලි සාහිත්‍ය ග්‍රන්ථයක් මූලාශ්‍රය වී බිහි වූ කෘතියකි. එම පාලි මූලාශ්‍රය වන්නේ,
(1) විනයට්ඨ කථාව ය. (2) ජාතකට්ඨ කථාව ය.
(3) මහාවංසට්ඨ කථාව ය. (4) ධම්මපදට්ඨ කථාව ය.
(5) දීඝනිකායට්ඨ කථාව ය.

*****

EXAMMOOD.LK
EXAMMOOD.LK

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2011 අගෝස්තු
**General Certificate of Education (Adv. Level) Examination, August 2011**
බෞද්ධ ශිෂ්ටාචාරය **II** / පැය තුනයි.
**Buddhist Civilization II / Three hours.**

උපදෙස් :
- I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

(මෙම කොටසින් ප්‍රශ්න **දෙකක්** තෝරාගෙන පිළිතුරු සපයන්න.)

01. (i) ක්ෂත්‍රිය වර්ණයට අයත් "ස්ව ධර්ම" නම් කරන්න.
(ii) බ්‍රාහ්මණ වර්ණයට නියමිත "ආපද් ධර්ම" පෙන්වා දෙන්න.
(iii) වෛදික සාහිත්‍යයට අයත් ග්‍රන්ථ **පහක්** නම් කරන්න.
(iv) කාන්තාව, සිය ජීවිත කාලය ම පිරිමි පක්ෂය යටතේ ජීවත්විය යුතුයැ'යි දක් වූ බ්‍රාහ්මණ නියමය ගෙනහැර දක්වන්න.
(v) බුදුසමයෙන්, කාන්තාවට හිමිකර දුන් ආගමික ස්වාධීනත්වය උදාහරණ **දෙකක්** මගින් පැහැදිලි කරන්න.

02. (i) ෂට් ශාස්තෘවරුන් හා ඔවුන්ගේ දර්ශනයන් නම් වශයෙන් දක්වන්න.
(ii) නිගණ්ඨනාථපුත්තතුමන්ගේ චාතුයාම සංවරය කෙටියෙන් හඳුන්වන්න.
(iii) "අකිරියවාදය" කුමක්ද'යි පූරණ කස්සපතුමන්ගේ ඉගැන්වීම් මගින් පැහැදිලි කරන්න.
(iv) "සියලු සත්ත්වයෝ වීර්ය රහිත ය, බල රහිත ය, ස්වශක්තියෙන් කළ හැක්කක් නැත." මක්ඛලී ගෝසාලතුමන්ගේ මේ ඉගැන්වීම පිළිබඳ බෞද්ධ ආකල්පය පෙන්වා දෙන්න.
(v) ශ්‍රමණ සම්ප්‍රදාය බ්‍රාහ්මණ සම්ප්‍රදායයෙන් වෙන් කොට හඳුනාගත හැකි ලක්ෂණ **පහක්** ගෙනහැර දක්වන්න.

03. (i) "රාජ්‍යයේ ප්‍රභවය" පිළිබඳ බෞද්ධ ඉගැන්වීම අග්ගඤ්ඤ සූත්‍රයට අනුව කෙටියෙන් දක්වන්න.
(ii) බුද්ධකාලීන භාරතයේ පැවැති ප්‍රධාන රාජාණ්ඩු **සතර** සහ ඒවා පාලනය කළ රජවරුන් නම් කරන්න.
(iii) බුදුරදුන් දවස භාරතීය ජන සමාජය කෘෂි ආර්ථික රටාවකට නැඹුරු ව සිටි බවට සාධක හතරක් පෙන්වා දෙන්න.
(iv) දැහැමි බෞද්ධ රජකු විසින් අනුගමනය කළ යුතු "දසරාජ ධර්ම" නම් කරන්න.
(v) "සතර අගතිය" කෙටියෙන් හඳුන්වන්න.

## II කොටස

(මෙම කොටසින් ප්‍රශ්න **තුනක්** තෝරාගෙන පිළිතුරු සපයන්න.)

04. (i) හොඳ - නරක විනිශ්චය කිරීමෙහි ලා උපයෝගී කොට ගත හැකි බෞද්ධ නිර්ණායක **තුනක්** විස්තර කරන්න.
(ii) බෞද්ධ පංචශීල ප්‍රතිපදාව සමාජ සහජීවනයට හා සංවර්ධනයට උපයෝගී කරගත හැකි ආකාරය පැහැදිලි කරන්න.
(iii) "අල්පේච්ඡතාව" සාමකාමී හා තෘප්තිමත් ජීවිතයක් ගොඩනගා ගැනීමට අදාළ වන්නේ කෙසේද'යි විමසීමක් කරන්න.
(iv) ධාර්මික ආශ්වාදයක් විඳගැනීම සඳහා බෞද්ධයා සිය විවේකය යොදාගත යුත්තේ කෙසේද'යි බෞද්ධ පූජා - උත්සව නිදසුන් කොට ගනිමින් පහදා දෙන්න.

05. (i) බුදුරජාණන් වහන්සේගේ සුවිශේෂ හැකියාවක් වූ "පුරිසදම්මසාරථී" ගුණය නිදසුන් දක්වමින් පෙන්වා දෙන්න.
(ii) බුද්ධ චරිතයෙන් ප්‍රකට වන පද්මාකාර ජීවිතය සනිදර්ශනාත්මක ව විස්තර කරන්න.
(iii) "ශාස්තෘවරයකු වශයෙන් බුදුරදුන් තුළ පැවැති ආගමික සහනශීලීත්වය උන්වහන්සේගේ ක්‍රියාකාරිත්වය තුළින් ප්‍රකට වෙයි." සනාථ කරන්න.
(iv) බුදුරජාණන් වහන්සේ තුළ පැවැති විශිෂ්ට ගුණාංග සමකාලීනයන්ගේ ඇගයීමට ලක් වූ ආකාරය නිදසුන් **තුනක්** මගින් පැහැදිලි කරන්න.

06. (i) බුද්ධ කාලීන භාරතයේ ශීඝ්‍රයෙන් බුදුසමය ව්‍යාප්ත වීමට හේතු වූ සාධක ගෙනහැර දක්වන්න.

(ii) "නාලන්දා විශ්වවිද්‍යාලය" පැරණි භාරතීය බෞද්ධ අධ්‍යාපනයේ ශ්‍රී විභූතිය ප්‍රකට කෙරෙන විද්‍යාස්ථානයක් ලෙස ඇගැයුමට ලක් කරන්න.

(iii) ප්‍රථම සංගීතියේ දී ඇතිකර ගත් එකඟතාවන් බුදුසමයේ චිරස්ථිතිය පිණිස හේතු වූ ආකාරය පැහැදිලි කරන්න.

(iv) "ධර්මාශෝක අධිරාජයා බෞද්ධ නරපතියෙකි." කරුණු දක්වමින් සනාථ කරන්න.

07. (i) "බ්‍රාහ්මණ සම්ප්‍රදාය" ආගමික සංවිධානයක් ලෙස මහින්දාගමනයට පෙර ශ්‍රී ලංකාවේ තහවුරු ව පැවැති බවට සාධක දක්වන්න.

(ii) ථෙරවාදී බුදුසමයේ චිර සංරක්ෂණය උදෙසා මහා විහාරයීය භික්ෂූන් ඉටු කළ මෙහෙය ඇගයීමට ලක් කරන්න.

(iii) ශ්‍රී ලාංකික ජන ජීවිතයේ සාරධර්ම පෝෂණය කිරීමෙහි ලා බෞද්ධ සදාචාර ධර්මවලින් ලැබුණු පිටිවහල කෙතෙක්ද'යි පෙන්වා දෙන්න.

(iv) පැරණි ශ්‍රී ලංකාවේ රාෂ්ට්‍රපාලන ප්‍රතිපත්ති සැකසීමෙහි ලා බුදුසමයෙන් ලැබුණු ආභාසය විස්තර කරන්න.

08. (i) බුරුම (මියන්මාර්) බෞද්ධ සංස්කෘතියේ ස්වර්ණමය යුගය ලෙස 'අනව්රත' රජුගේ පාලන සමය හැඳින්වීම කෙතරම් යුක්ති සහගතද'යි විමසීමක් කරන්න.

(ii) ගන්ධාර බුද්ධ ප්‍රතිමා කලාවේ දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ පෙන්වා දෙන්න.

(iii) භාරතීය ස්තූප නිර්මාණය සඳහා යොදාගත් ආකෘතිය ශ්‍රී ලංකාවේ දී නවීකරණය වෙමින් වැඩී ගිය අයුරු පැහැදිලි කරන්න.

(iv) ශ්‍රී ලාංකේය කලා සම්ප්‍රදායයවල පෝෂණයට බුදුසමයෙන් ලැබුණු නො මඳ සහාය පැරණි විහාර සිතුවම් කලාව ඇසුරෙන් විස්තර කරන්න.

*****

EXAMMOOD.LK
EXAMMOOD.LK